Department of Education,Sabaragamuwa Province/ Weekly School Department of Education,Sabaragamuwa Province/ Weekly School

පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව සබරගමුව - සති පාසල

විෂය} මව්බස

සතිය- 7

ශ්‍රේණිය:- 3

සැකසුම:- ජී.ජී . කරුණාරත්න මිය 3 ශ්‍රේණිය බාර ආචාර්ය ර/ඇඹි/ කොස්වැටිය විද්‍යාලය

- **චාරිකාවක විස්තර අඩංගු පහත වාර්තා කියවා අසා ඇති ප්‍රශන වලට පිළිතුරු සපයන්න?**

**චාරිකාවේ වාර්තාව**

**චාරිකාව යාම සඳහා අපි සියලු දෙනා පෙරවරු 7.30 ට පාසල ට රැස් වුණෙමු. විදුහල්පති තුමා චාරිකාවේ දී හැසිරිය යුතු ආකාරය පිළිබඳ අපට උපදෙස් දුන්නේ ය.අපි සියලු දෙනා එක පෙළට ගොස් බස් රථවලට ගොඩ වුණෙමු.දෙහිවල සත්තු වත්ත නැරඹීම සඳහා අපි පෙ.ව.8.00ට පාසලෙන් පිටත් වුණෙමු.පෙ.ව.9.00 පමණ වන විට අපි දෙහිවල සත්තු වත්ත අසලට පැමිණියෙමු.චාරිකාවට සහභාගී වූ සිසුන් සඳහා සත්තු වත්ත නැරඹීමට ප්‍රවේශ පත්‍ර ලබා ගත යුතු විය.එහි ගේට්ටුව අසල ම සත්තු වත්ත නැරඹිය යුතු ගමන් මඟ සටහන් පුවරුවක් තිබිණි.ගුරුතුමිය එම අංක අනු පිළිවෙළට අප සත්තු වත්ත නැරඹිය යුතු බව කීවාය.**

**මින් මැදුර ,කුරුළු උයන,සමනල උයන යනාදිය නැරඹූ අතර ම සිංහයා,කොටියා,වලහා,අශ්වයා,ජිරාෆ් වැනි සතුන් ද, කුරුල්ලන් ද, උරගයින් ද අපි දුටුවෙමු. අපි දිවා ආහාරය ගැනීමට එහි සකස් කර ඇති උද්‍යානයට ගියෙමු.**

**සවස් වරුවේ අපි අලි සෙල්ලම් බලා බෝහෝ සතුටු වුණෙමු.සත්තු වත්ත නැරඹීම අවසන් වන විට ප.ව.5.30 පමණ විය. ආපසු පාසලට පැමිණීම සඳහා අපි බසයට ගොඩ වුණෙමු.**

**01) චාරිකාව සඳහා ගියේ කොහේ ද? ...............................................**

**02) පාසලෙන් පිටත් වූ වේලාව කීය ද?...........................................**

**03) ඔබ සත්තු වත්තේ දී නැරඹූ ස්ථාන 02 ක් ලියන්න?**

**1) ...................................**

**2) ...................................**

**04) ඔබ සත්තු වත්තේ දී දුටු සත්තු තුන් දෙනෙක් නම් කරන්න?**

**1) ...................................**

**2) ...................................**

**3) ...................................**

**05) සත්තු වත්ත නැරඹීම අවසන් කළේ කීයටද? ..........................................**